UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) –DECEMBER 2018
ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2018 දෙසැම්බර්

# BUDDHIST PHILOSOPHY - I / බෞද්ධ දර්ශනය I - (BPG I)
(ආචාර විද්‍යාව හා මනෝවිද්‍යාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

## I - කොටස

1. ප්‍රාග් බෞද්ධ ඉන්දියාවේ පැවති ආගමික චාරිත්‍ර සම්බන්ධයෙන් බුදුන්වහන්සේ සිදු කළ සදාචාර විචාරය සාකච්ඡා කරන්න.

2. බුදුසමයට විශේෂ වූ ආචාර විද්‍යාත්මක අර්ථ ඇති වචන ඇසුරින් බුදුසමය තුළ ආචාර විද්‍යාවේ භූමිකාව පැහැදිලි කරන්න.

3. "ශීලයෙන් ප්‍රඥාවත් ප්‍රඥාවෙන් ශීලයත් පිරිසිදුවේ." මෙම කියමන පැහැදිලි කරන්න.

4. බුදුසමය සුබපරමවාදී ආචාරවිද්‍යාවක් අනුමත කරන බව නිගමනය කිරීම සුදුසුද? පිළිතුර සඳහා හේතු දක්වන්න.

5. උපයෝගීතාවාදී හා යුක්ත්‍යාත්මකවාදී යන දාර්ශනික ආචාර විද්‍යා න්‍යාය අනුව බෞද්ධ ආචාර විද්‍යාව පැහැදිලි කළ හැකිදැයි විමසන්න.

## II - කොටස

6. "බෞද්ධ චතුරාර්‍ය සත්‍යය ප්‍රධාන වශයෙන් ම අදාළ වන්නේ මිනිස් ජීවිතය පිළිබඳ මනෝවිද්‍යාත්මක විග්‍රහයකට ය." සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

7. බුදුසමයෙහි එන පපඤ්ච සංකල්පයෙහි මනෝවිද්‍යාත්මක වැදගත්කම සාකච්ඡා කරන්න.

8. බෞද්ධ දර්ශනයේ දක්නට ලැබෙන නාම-රූප පිළිබඳ විග්‍රහය මගින් මිනිසාගේ මනසේ ස්වභාවය තේරුම් ගත හැකිදැයි සාකච්ඡා කරන්න.

9. පුද්ගල වර්ගීකරණය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම්වල ඇති මනෝවිද්‍යාත්මක ලක්ෂණ පරීක්ෂා කරන්න.

10. චිත්තවේගයන්ගේ ස්වභාවය ගැන බෞද්ධ දෘෂ්ටිකෝණාගත විස්තරයක් කරන්න.

==========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2018
ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2018 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - II / බෞද්ධ දර්ශනය- II - (BPG - 2)
(බෞද්ධ දර්ශන ඉතිහාසය, තුලනය හා භාවිතය)

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි. (කාලය පැය තුනයි)

---

1. "බුදුදහමේ පහළ වීම සමකාලීන ආගමික හා දාර්ශනික දෘෂ්ටිවාද වලට දැක්වූ විචාරපූර්වක ප්‍රතිචාරයකි." විමසන්න.

2. බුදුන් වහන්සේගේ ඉගැන්වීම් තුළ හා ප්‍රාග් බෞද්ධ ඉගැන්වීම්වල එන සදාචාර හේතුකරණයන්හි සමවිෂමතා දක්වන්න.

3. "බුදුන් වහන්සේගේ සියලු ඉගැන්වීම් දුක හා දුකින් මිදීම පදනම් කොට දේශනා කර ඇත." සාකච්ඡා කරන්න.

4. බුදුදහම පෙන්වා දෙන චතුරාර්‍ය සත්‍ය සම්බන්ධ ප්‍රායෝගික අර්ථ කථනයන් පහදා දෙන්න.

5. "බුදුදහම පූර්ණ නියතිවාදය හෝ අන්තගාමී සවච්ඡන්දය සාධාරණීකරණය නොකරයි." විචාරයට ලක්කරන්න.

6. ආශ්‍රවක්ෂය කිරීමේ ක්‍රියාවලියේදී මනස හා කය අතර සබඳතාව තේරුම් ගැනීමේ වැදගත්කම මූලික සූත්‍රදේශනා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

අනෙක් පිටුවට ...

7. "ආචාර්ය නාගාර්ජුන පාදයන් ශූන්‍යතා දර්ශනය මගින් පැහැදිලි කරන්නේ බුදුන් වහන්සේ දේශනා කළ ප්‍රතීත්‍ය සමුත්පාදයයි." විචාරාත්මකව පිරික්සන්න.

8. බෞද්ධ දර්ශන ඉතිහාසයේ දැක්වෙන ක්‍ෂණවාදයෙහි වර්ධනය පිළිබඳ විමසීමක් කරන්න.

9. යෝගාචාර දර්ශන සම්ප්‍රදායේ මූලික ඉගැන්වීම් කෙතෙක් දුරට මුල් බුදුසමයේ ඉගැන්වීම් සමග ගැළපේදැයි සාකච්ඡා කරන්න.

10. පහත සඳහන් මාතෘකා අතරින් ඕනෑම හතරකට ප්‍රාමාණික සටහන් ලියන්න.

I. අන්තරාභව

II. භවංගචිත්ත

III. ත්‍රිකාය සංකල්පය

IV. බෝධිසත්ව සංකල්පය

V. සම්මුතිසච්ච හා පරමත්ථසච්ච

VI. ආලය විඥානය

=========

UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

GENERALDEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – DECEMBER 2018

ශාස්ත්‍රවේදී සමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) -2018 දෙසැම්බර්

BUDDHIST PHILOSOPHY - III / බෞද්ධ දර්ශනය- III - BPG - 3
(පාරභෞතික විද්‍යාව හා ඥානමීමාංසාව)

එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් ඇතුළත් වන සේ
ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.

(කාලය පැය තුනයි.)

---

## I - කොටස

1. දෙවියන් වහන්සේ හා පරම යථාර්ථය පිළිබඳ බෞද්ධ විචාරය පරීක්ෂා කරන්න.

2. අර්ථය හා සත්‍යය විවරණය කිරීමෙහිලා ථේරවාදීන් විසින් සම්මුති-පරමත්ථ විභාගය උපයෝගී කොට ගත් අයුරු පැහැදිලි කරන්න.

3. අනුභූතිය පිළිබඳ බෞද්ධ විවරණයෙහිලා ඉන්ද්‍රිය බද්ධ විෂය මෙන් ම අතීන්ද්‍රිය විෂය ද ඇතුළත් කොට ඇත්තේ කවර හෙයින් දැයි පැහැදිලි කරන්න.

4. උපනිෂද් දර්ශනයෙහි එන ආත්මන් සංකල්පය මෙන් නිත්‍ය පදාර්ථයක් ඉදිරිපත් නොකර බුදුසමයෙහි අනාත්මය ප්‍රකට කර ඇති අයුරු පරීක්ෂා කරන්න.

5. බුදුසමයේ ඉගැන්වෙන නිර්වාණය අධිභෞතික සත්තාවක්ද? සාකච්ඡා කරන්න.

## II - කොටස

6. සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා යන සියල්ල ඥාන ස්වරූපයෙන් ගත හැකිද? ඒවා අතර වෙනස්කම් ඇත්දැයි පැහැදිලි කරන්න.

අනෙක් පිටුවට ...

7. "බුදුන් වහන්සේ සම්ප්‍රදායවාදියෙකු (අනුස්සවික) වත් තාර්කිකවාදියෙකු (තක්කී/වීමංසී) වත් නොවෙති." පැහැදිලි කරන්න.

8. මුල් බුදු සමයෙහි ඥානය හා විශ්වාසය අතර වෙනසක් දැක්වේද? සාකච්ඡා කරන්න.

9. පුද්ගල සංකල්පය මුල් බුදුසමයෙහි ස්කන්ධ පහක් වශයෙන් විශ්ලේෂණය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

10. බෞද්ධ ඉගැන්වීම්වල සඳහන් වන අභිඥාවන් පැහැදිලි කර ඒවා ඇසුරින් මතුවන ඥානමීමාංසාවාදී ගැටළු පරීක්ෂා කරන්න.

===========